
# පාර්ලිමේන්තු මැතිවරණය
# 2020




## පාර්ලිමේන්තු මැතිවරණයක් පවත්වීමේදී අනුගමනය කළ යුතු නියමයන් පිලිබන්ඳ නීතිමය විග්‍රහය

පැෆ්රල්

# පාර්ලිමේන්තු මැතිවරණය

## පාර්ලිමේන්තු මැතිවරණයක් පැවැත්වීමේදී අනුගමනය කළ යුතු නියමයන් පිළිබඳ නීතිමය විග්‍රහය


**රචනය**

නීතිඥ තරංග වීරසිංහ

සංස්කරණය

නීතිඥ ජයන්ත චන්ද්‍රසිරි


2020.03.07


**ප්‍රකාශනය**

නිදහස් හා සාධාරණ මැතිවරණයන් සඳහා ක්‍රියාකාරීත්වය

(PAFFREL)

## ප්‍රවේශය

## පාර්ලිමේන්තු මැතිවරණය හා ජනතාව

ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන 1978ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 03 වන ව්‍යවස්ථාවට අනුව 'ජනරජයේ පරමාධිපත්‍ය' යන්නෙන් අදහස් කරන්නේ කිසියම් රටකට නීති පැනවීමට, එම නීතිය ක්‍රියාත්මක කිරීමට හා එරට නීතිය හා යුක්තිය පසිඳලීමට ඇති බලයයි. අද අප ජීවත් වන දියුණු ප්‍රජාතන්ත්‍රවාදී පාලන රාමුවක් තුළ මෙම පාලන බලතල ජනතාව විසින් ක්‍රියාත්මක කරනවා යන්න ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඉහත වගන්තියේ සරල අර්ථයයි. එය වඩාත් අර්ථවත් කරනු සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පරමාධිපත්‍යය යන්නට ඉහත කී පාලන බලතල සමග ජනතාවගේ මූලික අයිතිවාසිකම් සහ ඡන්ද බලයද ඇතුළත් කර ඇත.

ජනතා පාලන ක්‍රම ආරම්භ වූ මුල් යුගයේදී සියලු පුරවැසියන් එක්වී මෙම පාලන බලතල ක්‍රියාත්මක කළ නමුත් සමාජය සංකීර්ණ වෙත්ම නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රම ආරම්භ වී ඇත. එනම්, අප වෙනුවෙන් අපසතු මෙම පාලන බලතල ක්‍රියාත්මක කිරීමේ වගකීම අද අපගේ නියෝජිතයින්ට භාරදී ඇත. මැතිවරණයක් යනුවෙන් අදහස් කෙරෙන්නේ මෙම ක්‍රියාවලිය තුළ'ජනතාව සතු පරමාධිපත්‍ය බලය' ජනතා නියෝජිතයින්ට විධිමත්ව භාරදීමේ- පැවරීමේ කාර්යයයි. එසේ බලන කළ පාර්ලිමේන්තු මැතිවරණයක් යනු ජනතාව සතු නීති පැනවීමේ බලයජනතා නියෝජිතයින් වෙත භාරදීමේ ක්‍රියාවලියයි. ප්‍රජාතන්ත්‍රවාදී රාමුවක් තුළ දේශපාලන පක්ෂ හා කණ්ඩායම් වශයෙන් අපේක්ෂකයින් විශාල සංඛ්‍යාවක් මැතිවරණයක් සඳහා ඉදිරිපත් වන බැවින් ප්‍රායෝගිකව සිදුවන්නේ වඩාත් සුදුසු නියෝජිතයින් තෝරා ගැනීමයි.

රටක් තුළ ප්‍රජාතන්ත්‍රවාදය සහ යහපාලනයක් ක්‍රියාත්මක වීමට නම් එසේ තේරීපත් විය යුත්තේ සැබෑ ජනතා නියෝජිතයින්ය.එනම්, සැබෑ ලෙස ජනතාඅපේක්ෂා මුදුන් පත් කරනු ලබන සහ ජනතා විශ්වාසය දිනාගත් නියෝජිතයින්ය. සැබෑ ජනතා නියෝජිතයින් තේරී පත්වීමට නම් පවත්වනු ලබන මැතිවරණය නිදහස් හා සාධාරණ එකක් විය යුතුය. දූෂිත ලෙසමැතිවරණ නීතිය උල්ලංඝණය කරමින් පවත්වනු ලබන මැතිවරණ කිසිසේත්ම නිදහස් හා සාධාරණ නොවේ.

මෙම පොත් පිංච මගින් අපේක්ෂා කරනු ලබන්නේ පාර්ලිමේන්තුව සඳහා නියෝජිතයන් තෝරාපත් කර ගැනීමට අදාළව නිදහස් සහ සාධාරණ මැතිවරණයක් සඳහා අවශ්‍ය කෙරෙන නීතිමය විධිවිධාන පිළිබඳව මනා දැනුමක් මැතිවරණයට සම්බන්ධ සියලුම පාර්ශවයන් වෙත ලබා දීමයි. එය ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කරවීම සඳහා ඉවහල් වනු ඇති බව අපගේ විශ්වාසයයි.

**රෝහණ හෙට්ටිආරච්චි**

විධායක අධ්‍යක්ෂක

## ශ්‍රී ලංකා පාර්ලිමේන්තු මැතිවරණ නීතිය

පාර්ලිමේන්තු මැතිවරණයකදී මන්ත්‍රීවරයන් තෝරාගැනීම පිළිබඳපිළිබඳ කාර්ය පටිපාටිය හා මැතිවරණ ක්‍රියාවලිය පිළිබඳ අදාළ නීතිය ශ්‍රී ලංකාවේ නොයෙක් අණපනත්වල සඳහන්ව තිබේ.

01. 1978ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 88 -104 දක්වා ව්‍යවස්ථාවන්

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට කරන ලද 17 19 දරන සංශෝධනයන්ද අදාල වේ

02. පාර්ලිමේන්තු මැතිවරණ පනත

ශ්‍රී ලංකා පාර්ලිමේන්තු මැතිවරණය සම්බන්ධ නීතිය ප්‍රධාන වශයෙන් සංයුක්ත වන්නේ වන්නේ 1981අංක 01 දරණ පාර්ලිමේන්තු මැතිවරණ පනත තුළය. ඒ සමඟම එම පනතට සිදුකරන ලද පහත දැක්වෙන සංශෝධනයන් ද අදාළ වේ.

- 1988 අංක 15දරන පාර්ලිමේන්තු මැතිවරණ (සංශෝධන) පනත.
- 1988 අංක 29 දරණ පාර්ලිමේන්තු මැතිවරණ (සංශෝධන) පනත.
- 1988 අංක 54දරණ පාර්ලිමේන්තු මැතිවරණ (සංශෝධන) පනත.
- 1988 අංක 35දරණ ඡන්ද විමසීම් (විශේෂ විධිවිධාන) පනත.

03.වෙනත් නීතිමය විධිවිධාන

- දණ්ඩනීති සංග්‍රහය 169 අ - ළෟ දක්වා වගන්ති.
- 2004 අංක 14 දරණ පාර්ලිමේන්තු පනත- ඡන්දය භාවිතා කිරීම සඳහා ජාතික හැඳුනුම්පත අනිවාර්ය කිරීම.

04. මැතිවරණ කොමිෂන් සභාව විසින් කලින් කලට නිකුත් කරනු ලබන නියෝග චක්ලේඛන හා ගැසට් නිවේදන නඩු තීන්දු.

## පාර්ලිමේන්තු මැතිවරණය පිළිබඳ පොදු විධිවිධාන

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව පාර්ලිමේන්තුව මන්ත්‍රීවරුන් 225 දෙනෙකුගෙන් සමන්විත වන අතර එයින් 196දෙනෙකු මහ මැතිවරණයකින් තෝරා පත්කර ගනු ලබයි. ඉතිරි 29 පත්වන්නේ

ජාතික ලැයිස්තුවෙනි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ X සහ XI යන පරිච්ඡේදවල පාර්ලිමේන්තු කාර්ය පටිපාටිය හා මන්ත්‍රීවරුන්ගේ ව්‍යවස්ථාදායකමය බලතල හා කාර්යයන් දක්වා ඇත. 2015 වර්ෂයේ සම්මත කර ගන්නට යෙදුණු 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් 1978 ආණ්ඩුකම ව්‍යවස්ථාවට සංශෝධන ගණනාවක් එකතු කරගන්ගා ලදී. ඒ අනුව එතෙක් පැවති වසර 6ක් වූ පාර්ලිමේන්තුවේ ධූර කාලය වසර 5කට සීමා කරන ලදී.

**මැතිවරණ පරිපාලනය**

19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය මගින් සාමාජිකයන්තිදෙනෙකුගෙන් සමන්විත මැතිවරණ කොමිෂන් සභාවක් පිහිටුවන ලදී. ඒ අනුව මැතිවරණය පැවැත්වීම සහ සියලුම මැතිවරණ පරිපාලන කටයුතු මැතිවරණ කොමිෂන් සභාව විසින් සිදු කරනු ලැබේ. එකී මැතිවරණය පැවැත්වීමේ කාර්යයට අදාළව උපමාන සකස් කිරීම සඳහා මැතිවරණ කොමිසමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් බලය පවරා ඇත.

**වගු 01 දිස්ත්‍රික්ක අනුව තෝරාපත්කර ගත යුතු මන්ත්‍රී සංඛ්‍යාවසහ නාමයෝජනා පත්‍රයට ඇතුළත් විය යුතු අපේක්ෂකයින් සංඛ්‍යාව**

| මැතිවරණ කොට්ඨාසයේ අංකය හා නම | තෝරා පත්කර ගතයුතු මන්ත්‍රීවරු සංඛ්‍යාව | නාමයෝජනා පත්‍රයට ඇතුළත් විය යුතු අපේක්ෂකයින් සංඛ්‍යාව |
|---|---|---|
| 01.කොළඹ | 19 | 22 |
| 02.ගම්පහ | 18 | 21 |
| 03.කළුතර | 10 | 13 |
| 04.මහනුවර | 12 | 15 |
| 05.මාතලේ | 05 | 08 |
| 06.නුවරඑළිය | 08 | 11 |
| 07.ගාල්ල | 09 | 12 |
| 08.මාතර | 07 | 10 |
| 09.හම්බන්තොට | 07 | 10 |
| 10.යාපනය | 07 | 10 |
| 11.වන්නි | 06 | 09 |

| | | |
|---|---|---|
| 12.මඩකලපුව | 05 | 08 |
| 13.දිගාමඩුල්ල | 07 | 10 |
| 14.ත්‍රිකුණාමලය | 04 | 07 |
| 15.කුරුණෑගල | 15 | 18 |
| 16.පුත්තලම | 08 | 11 |
| 17.අනුරාධපුරය | 09 | 12 |
| 18.පොළොන්නරුව | 05 | 08 |
| 19.බදුල්ල | 09 | 12 |
| 20.මොණරාගල | 06 | 09 |
| 21.රත්නපුර | 11 | 14 |
| 22.කෑගල්ල | 09 | 12 |

1978ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සමානුපාතික නියෝජන ක්‍රමය හඳුන්වාදීමෙන් පසු පාර්ලිමේන්තු මහ මැතිවරණය සඳහා මන්ත්‍රීවරුන් තෝරාගනු ලබන්නේ සමානුපාතික නියෝජන ක්‍රමය අනුවය. මන්ත්‍රීවරුන් තෝරාපත් කරගැනීම සඳහා පරිපාලන දිස්ත්‍රික්කයක් එක් ඡන්ද ප්‍රදේශයක්/කොට්ඨාසයක් ලෙස සලකනු ලබන අතර, එක් පරිපාලනදිස්ත්‍රික්කයට තෝරාපත්කර ගත යුතු මන්ත්‍රී සංඛ්‍යාව එම දිස්ත්‍රික්කයට තෝරා පත්කර ගත යුතුය.

**මන්ත්‍රීවරයෙකු ලෙස තේරී පත්වීමට නුසුදුසුකම්**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 89සහ 91(1)ව්‍යවස්ථාවේ මන්ත්‍රීවරයෙකු ලෙස තේරී පත්වීමට නුසුදුසුකම් දක්වා ඇත. ඒ අනුව පහත සඳහන් පුද්ගලයන් හට අපේක්ෂකයින් විය නොහැකිය.

1. ශ්‍රී ලංකා පුරවැසියකු නොවීම.

2. වසර අවුරුදු 18 සම්පූර්ණ නොවූ අයෙකු වීම.

3. ශ්‍රී ලංකාවේ පවතින නීතියක් අනුව සිහිවිකල් තැනැත්තෙකු ලෙස තීරණය කර ඇති අය.

4. අවුරුදු දෙකකට නොඅඩු කාලයක් බන්ධනාගාර ගත කළ හැකි වරදකට වරදකරුවී මාස හයකට නොඅඩු කාලයක් සිරදඬුවමකට නියමව ඇති අයත්, මරණ දඬුවමක්

වෙනුවට සිර දඬුවමක් විඳිමින් සිටින අයත්, පසුගිය අවුරුදු හත ඇතුළත එම දඬුවම සම්පූර්ණයෙන්ම විඳ ඇති අයත්, එහෙත් කොන්දේසි රහිත සමාවක් ලැබූ අයට ඉදිරිපත් විය හැකිය.

5. ජනමත විචාරණයක දී, ජනාධිපතිවරණයකදී හෝ පාර්ලිමේන්තු ඡන්ද විමසීමකදී නීති විරෝධී ක්‍රියාවට හෝ දූෂණ ක්‍රියාවකට සම්බන්ධ වීම නිසා අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබූ දිනයේ සිට අවුරුදු හතක් ඉක්මවා නොමැති අයෙකු වීම.

6. අල්ලස් චෝදනාවකට වරදකරුවී අවුරුදු හතක් ඉක්මවා නොමැතිනම්.

7. පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේ නීතිය යටතේ අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබූ අවුරුදු හතක් නොඉක්මවූවන්,

8. රාජ්‍ය ආයතනයක දූෂණ ක්‍රියාවන් සම්බන්ධව නීතියෙන් වරදකරු වී අවුරුදු පහක් ඉක්මවා නැතිනම්,

9. ජනමත විචාරණයකදී, ජනාධිපතිවරණයකදී හෝ පාර්ලිමේන්තු ඡන්ද විමසීමකදී නීති විරෝධී ක්‍රියාවකට අනුරූපවන වරදක් සම්බන්ධව වරදකරුවී අවුරුදු තුනක් නොඉක්මවූවන්.

10. පාර්ලිමේන්තුවෙන් ප්‍රජා අනුශක්නුතා යෝජනාවක් සම්මත කරනු ලැබූඅනුශක්නුතා කාලය ඉක්මවා නැතිවවුන්.

11. බොරු සාක්ෂිදීම, වරදක තොරතුරක් දැනුම් නොදීම, වරදක් පිළිබඳව අසත්‍ය තොරතුරු සැපයීම, සාක්ෂි විභාගයකදී අවශ්‍යය ලේඛන හෝ ද්‍රව්‍ය විනාශකිරීම හා සම්බන්ධ වරදකට වරදකරු වී සත් වර්ෂයක් නොඉක්මවූ අය.

12. ශ්‍රේෂ්ඨාධිකරණයේ හෝ අභියාචනාධිකරණයේ හෝ මහාධිකරණයේ හෝ දිසාඅධිකරණයේ යම් විනිශ්චයකාරවරයෙකුගෙන් සංයුක්ත විශේෂ ජනාධිපති කොමිෂන් සභාවක නියමය අනුව කොමිසම ඉදිරියේ පෙනී නොසිටීම, ප්‍රතිඥාවක් හෝ දිවුරුමක් දීම ප්‍රතික්ෂේප කිරීම, අසන ලද ප්‍රශ්නයකට පිළිතුරු නොදීම, තමන් ළඟ ඇති ලේඛන හෝ ද්‍රව්‍ය හෝ තොරතුරු ඉදිරිපත් නොකිරීමට ආදියෙන් කොමිෂමට අපහාස කිරීමේ චෝදනාවකට වරදකරු වී අවුරුදු හතක් ඉක්මවා නොමැති අයෙකුවීම.

13. ජනාධිපති පදවිය දරණ තැනැත්තා

14. අධිකරණ නිලධාරීන් (සමථකරුවන් මේ යටතට නොවැටේ)

15. පරිපාලන කටයුතු පිළිබඳව පාර්ලිමේන්තු මහකොමසාරිස්

16. පාර්ලිමේන්තුවේ මහලේකම්වරයා සහ ඔහුගේ කාර්ය මණ්ඩලයේ අය

17. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකයින්

18. මැතිවරණ කොමිෂන් සභාවේ සභාපති

19. විගණකාධිපති

20. 1970.11.18 දිනදී ආරම්භක වාර්ෂික වැටුප රුපියල් 6700/= නොඅඩුව පැවති ධූර දරන රාජ්‍ය නිලධාරීන්

21. 1970.11.18 දිනට පසුව ඇති කරන ලද රාජ්‍ය ධූරයක වාර්ෂික ආරම්භක වැටුප 1970.11.18 දිනයේදී රුපියල් 6700/= අඩු නොවන රාජ්‍ය සේවකයින්

22. 1970.11.18දිනට ආරම්භක වැටුප රුපියල් 7200/= කට අඩු නොවූ රාජ්‍ය සංස්ථා නිලධාරීන්

23. ත්‍රිවිධ හමුදා සාමාජිකයින්

24. පොලිස් නිලධාරීන් හා පොලීසියේ කාර්යය ඉටුකරන රාජ්‍ය නිලධාරින්, ග්‍රාම නිලධාරින් ද ඇතුළුව

25. රජයේ දෙපාර්තමේන්තුවක් හෝ රාජ්‍ය සංස්ථාවක් සමඟ යම් ගිවිසුමකට ඇතුළත් ව සිටින්නන්

26. වස්තුභංගත්වයට පත්වූ බවට ප්‍රකාශ කරනු ලැබූවන්

27. ගතවූ අවුරුදු හත ඇතුළතදී පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයෙකු වශයෙන් කටයුතු කිරීමේ කාර්යයක් සඳහා තුටු පඬුරක් ගත් අයෙකු ලෙස අධිකරණයකින් හෝ විශේෂ ජනාධිපති කොමිෂමකින් තීරණය කරනුලැබූ අය

28. පළාත් පාලන ආයතනයකට මන්ත්‍රීවරයන් තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීමක දී යම් නීතියක් අනුව ඡන්දය දීමෙන් වළක්වා ඇති අය

29. පාර්ලිමේන්තු මන්ත්‍රී ධූර දරන්නන්

30. මැතිවරණ කොට්ඨාස එකකට වැඩි ගණනකට අපේක්ෂකයෙකු වශයෙන් නාම යෝජනා කර ඇති අය

මීට අමතරව 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් ද්විත්ව පුරවැසිභාවය සහිත පුද්ගලයන් ද පාර්ලිමේන්තුවට තේරී පත්වීම සඳහා සුදුසුස්සන් ලෙස නම් කර ඇත.

**නාම යෝජනා භාරදීම**

පාර්ලිමේන්තුව විසුරුවා හරින ප්‍රකාශනයට හෝ මැතිවරණයක් පවත්වන ලෙස නියම කරන යම් කියමනක දී ජනාධිපතිවරයා විසින් තේරීම්භාර නිලධාරීන් විසින් නාමයෝජනා පත්‍ර භාරගනු ලබන කාලසීමාව සඳහන් කරනු ලබයි.නාම යෝජනා භාර ගැනීමේ කාල සීමාව එකී ප්‍රකාශනය හෝ නියමය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ දිනයෙන් දින 10 කට පසු එළඹෙන දිනයේ සිට දින 10ක කාලය තුළදී වේ. නාම යෝජනා භාරදිය යුත්තේ දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරියා වෙතය. නාමයෝජනා පත්‍ර පහත ආකාරයට සකස් විය යුතුය.

1. නියමිත ආකෘතියකට අනුව සකස් කර තිබිය යුතුය.

2. අදාළපරිපාලන දිස්ත්‍රික්කයෙන්, එන ඡන්ද කොට්ඨාසයෙන් තෝරාපත්කරගත යුතු මන්ත්‍රී සංඛ්‍යාවට වඩා අපේක්ෂකයින් තුන්දෙනෙකුගේ නම් ඊට ඇතුළත් කළ තිබිය යුතුය.

3. අපේක්ෂකයන් අත්සන් කර තිබිය යුතුය.

4. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 07 උපලේඛනයේ දැක්වෙන ආකෘතිය අනුව ප්‍රතිඥාවක් අත්සන් කර තිබිය යුතුය.ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආරක්ෂා කරන බවට හා ශ්‍රී ලංකා දේශය තුළ වෙනම රජයක් පිහිටුවීමට කෙළින්ම හෝ අන්‍යාකාරයකින් ආධාර අනුබල නොදෙන බවට ප්‍රතිඥා දීම මේ යටතේ සිදු කෙරේ.

5. දේශපාලන පක්ෂයක් නම් නාමයෝජනා පත්‍රය පක්ෂ ලේකම්වරයා විසින්ද ස්වාධීන කණ්ඩායමක් නම් ලේඛනයේ මුලට නම සඳහන් අපේක්ෂකයා විසින්ද අත්සන් කළ යුතුය.

6. නාමයෝජනා පත්‍රයකකරන ලද අත්සන සාම විනිසුරුවරයෙකු හෝ ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු විසින් සහතික කර තිබිය යුතුය.

7. භාරදිය යුත්තේ එක් නාමයෝජනා පත්‍රයක් සහ එක් පිටපතක් පමණි.

පක්ෂයක නාම යෝජනා පත්‍රයක් නම් එම පක්ෂයේ ලේකම් විසින් හෝ බලයලත් නියෝජිතයෙකු විසින් භාර දීම සිදුකළ හැකිවනඅතර ස්වාධීන කණ්ඩායමකනම් එහි මුලටම නම සඳහන් තැනැත්තාට භාරදීම සිදු කළ හැකිය. කිසියම් අවස්ථාවක එසේ කළ නොහැකිනම් ලේඛනයේ දෙවැනියට නම සඳහන් අපේක්ෂකයා විසින් එය කළ යුතුය.

නාම යෝජනා පත්‍රයක් භාරගැනීම ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත් අදාළ තේරීම්භාර නිලධාරියා විසින් එය ඉදිරිපත් කළ තැනැත්තාට ඒ බව දැනුම් දිය යුතුය.

තේරීම්භාර නිලධාරියා විසින් භාරගත් නාමයෝජනා පත්‍රයෙහි පිටපතක් තම දැන්වීම් පුවරුවෙහි ප්‍රදර්ශනය කළ යුතුය. ඉදිරිපත් කරන ලද නාම යෝජනා පත්‍රයක යම් අත්හැරීමක් හෝ ලිපි දෝෂයක් ඇතැයි ඉදිරිපත් කළ අය හට පෙනී ගිය අවස්ථාවක නාමයෝජනා කාලය ඉකුත්වීමට පෙර නිවැරදි කිරීම සඳහා ඉල්ලීමක් කළ හැකිය. අනවධානය නිසා වූ දෝෂයක් නිවැරදි කිරීමට ඉඩ සලසනු ලැබීය හැකිය. නාමයෝජනා පත්‍රය ප්‍රදර්ශනය කළ පසු පහත හේතූන් මත විරෝධතා ඉදිරිපත් කළ හැකිය. එය ලිඛිත විය යුතු වන අතර විරෝධතාව දක්වන පුද්ගලයාගේ අත්සනින් යුක්ත විය යුතුය.

1. අපේක්ෂකයා හඳුනාගැනීම සඳහා දී ඇති තොරතුරු ප්‍රමාණවත් නොවීම.

උදාහරණ:-නම් අසම්පූර්ණ හෝ අවිනිශ්චිත වීම.

2. අසම්පූර්ණ නාමයෝජනා පත්‍ර භාර දී තිබීම.(මීට පෙර දක්වා ඇති ආකාරයට පරිබාහිරව).

3. නාමයෝජනා පත්‍රයේ ඇති කරුණුමඅනුව මන්ත්‍රීවරයෙකු වීමට නුසුදුසු බව පෙනී යාම.

4. නීතිවිරෝධී ක්‍රියාවන් හෝ දූෂණ ක්‍රියාවක් නිසා මන්ත්‍රීවරයෙකු වශයෙන් පත්වීමට නොහැකි වීමට හෝ ඡන්ද පෙත්සමක් පිළිබඳ නඩු තීන්දුවක් නිසා මන්ත්‍රීවරයෙකු වීම නුසුදුසු වීම,(ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 91 ව්‍යවස්ථාවඅනුව මේ සාක්ෂි ඇතිව තහවුරු කළ යුතුය).

ඉහත දක්වා ඇති 1 ,2සහ 3 යන කරුණු අදාළ තේරීම්භාර නිලධාරිවරයාට තීරණය කළ හැකිවන අතර,4 වන කාරණය පිළිබඳව අභියාචනාධිකරණය වෙත යොමු කළ යුතුය. අභියාචනාධිකරණයේ තීරණය අවසන් තීරණය වන අතර විරෝධතාවය නොපිළිගතහොත් අදාළ පුද්ගලයාගේ/පුද්ගලයන්ගේ අපේක්ෂකත්වය අහෝසි වේ.

ඉහත අංක4 යටතේ දක්වා ඇති කිසියම් හේතුවක් නිසා හෝ ප්‍රජා අනුශක්තාවකට ලක්ව සිටින්නෙකු තමා නුසුදුසු බව දැන දැනම නාමයෝජනා පත්‍රයක නම ඇතුළත් කළේ නම් වරදකරුවෙකු වන අතර රුපියල් 1000/= නොඉක්මවන දඩයකට හෝ මාස තුනක් දක්වා සිරදඬුවමකට යටත් වීමට සිදුවේ.

**නාමයෝජනා භාරගැනීමෙන් පසු ක්‍රියාවලිය**

එකම නාම යෝජනා පත්‍රයක් පමණක් ඉදිරිපත් වී ඇති අවස්ථාවක අදාළ පක්ෂයේ ලේකම්වරයා හෝ ස්වාධීන කණ්ඩායමක නම් නායකයා සමග සාකච්ඡා කර මන්ත්‍රීවරුන් නම් කිරීම සිදු කරනු ලබයි. නාමයෝජනා පත්‍ර දෙකක් හෝ වැඩි ගණනක් භාරගනු ලැබූ අවස්ථාවක ඒ ඒ පත්‍රයට අදාළ ලකුණු වෙන් කර දිය යුතුය. ස්වාධීන කණ්ඩායම් ඇතොත් ඒවා සඳහා ද ලකුණු වෙන්කර දීම කළ යුතුය. පක්ෂයකට වෙන්කර දෙන ලද ලකුණක් / ලාංඡනයක් කිසිම හේතුවක් නිසා වෙනත් පක්ෂයකට හෝ ස්වාධීන කණ්ඩායමකට ලබාගත නොහැකිය. නාමයෝජනා භාර ගැනීමෙන් පසුව අදාළ තේරීම්භාර නිලධාරීන් විසින් එක් එක් ලැයිස්තුවේ ඇති අපේක්ෂකයින්ගේ නම් සිංහල අකාරාදී පිළිවෙලට සකස්කර එක් එක් අපේක්ෂකයාට අනුක්‍රමික අංකයක් ලබාදිය යුතුය. ස්වාධීන කණ්ඩායම්වලටද හඳුනාගැනීමේ අංකයක් ලබා දිය යුතුය.

පුරපසළොස්වක දිනයක් හෝ රජයේ නිවාඩු දිනයක් නොවන දිනයක ඡන්ද විමසීම පැවැත්විය යුතු අතර දැන්වීම පළ කළ දිනයේ සිට සති පහකට අඩුනොවූත්, සති හතකට වැඩි නොවූත් කාලයක් අතර දිනයක් ඡන්ද විමසීමේ දිනය ලෙස ප්‍රකාශයට පත් කළ යුතුය. රජයේ නිවාඩු දිනයක හෝ පසළොස්වක පෝය දිනයක ඡන්ද විමසීම් නොකළ යුතු නමුත්, යම් හේතුවක් නිසා මැතිවරණ දිනය රජයේ නිවාඩු දිනයක් බවට ප්‍රකාශයට පත් කළහොත් ඡන්ද විමසීමේ වලංගුභාවය නැති නොවේ.

පරිපාලන දිස්ත්‍රික්කයේ එක් එක් ඡන්ද කොට්ඨාසය සඳහා වන ඡන්ද පොළවලපිහිටීමහා ඡන්දදායකයින් සඳහා විශේෂ ඡන්ද පොළවල් පිහිටුවනු ලැබේ නම් ඒවා ද සඳහන් කරමින් ගැසට් පත්‍රයේ දැන්වීමක් පළ කළ යුතුය. විශේෂ හේතුවක් නිසා ඡන්දදායකයින් සඳහා වෙනම ඡන්දපොළක් පිහිටුවීම සිදු නොවන්නේ නම් එක් එක් ඡන්ද කොට්ඨාසයක් සඳහා පිහිටුවිය යුත්තේ එක් ඡන්ද පොළක් පමණි. ඒ ඡන්ද පොළ පිහිටුවිය යුත්තේ ඡන්ද කොට්ඨාශය තුළමය. විශේෂ හේතුවක් යෙදුනහොත් ඡන්ද කොට්ඨාසයෙන් පිටත ඡන්දපොළක් පිහිටුවීමට තේරීම්භාර

නිලධාරියාට බලය ඇත.(නිදසුන් :- විශේෂ හේතුවක් නිසා අවතැන්වූවන් සිටින අවස්ථාවන්වලදී).

නාම යෝජනා පත්‍ර භාර දුන් දිනයත්, ඡන්ද විමසීම පවත්වනු ලබන දිනයත් අතරතුර යම් අපේක්ෂකයෙකු මිය ගියහොත් ඒ නිසා ඒ තැනැත්තාගේ නම ඇතුළත් අපේක්ෂක නාම ලැයිස්තුව අවලංගු වන්නේ හෝ අලුතින් නාමයෝජනා පත්‍ර භාර ගැනීමට හෝ සිදුවන්නේ නැත. අතිරේක නම් තුනක් වැඩිපුර අපේක්ෂක ලැයිස්තුවට අඩංගු කර ඇතිබැවිනි.

නොවැළැක්විය හැකි හේතුවක් නිසා කිසියම් පරිපාලන දිස්ත්‍රික්කයක ඡන්ද විමසීම නියමිත දිනයේදී පැවැත්වීමට නොහැකි වුවහොත් ගැසට් පත්‍රයේ පළ කරන දැන්වීමක් මගින් ඒ දිස්ත්‍රික්කයේ ඡන්ද විමසීම සඳහා වෙනම දිනයක් ප්‍රකාශයට පත් කළ යුතුය. ඒ දිනය ගැසට් නිවේදනය පළකරනු ලබන දිනයේ සිට දින දහහතරක් නොඉක්මවන දිනයක් විය යුතුය.

තේරීම්භාර නිලධාරීන් විසින් එක් එක් ඡන්ද හිමියා වෙත ඡන්ද විමසීමේ දිනයට අඩුම වශයෙන් දින හතරකටවත් පෙර ලැබෙන සේ නිල ඡන්ද දැන්වීම් තැපෑලෙන් යැවීමට කටයුතු කළ යුතුය. එම පත්‍රිකාවේ පහත සඳහන් තොරතුරු අන්තර්ගත විය යුතුය.

1. පරිපාලන දිස්ත්‍රික්කයේ නම

2.ඡන්ද හිමියාගේ නම, ලිපිනය හා ලියාපදිංචි අංකය (ඡන්ද හිමි නාමලේඛනය අංකය)

3. ඡන්ද කොට්ඨාශය හා නියමිත ඡන්ද පොළ

4. ඡන්ද විමසීමේ දිනය හා වේලාව

**ඡන්ද විමසීම පැවැත්වෙන දින කාර්යපටිපාටිය**

1.මූලික කටයුතු

ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් ඡන්ද පත්‍රිකා, නිල මුද්‍රාව, නිල ලකුණ සහ ඡන්ද හිමි නාම ලේඛනවල පිටපත් ඡන්දපොළ නියෝජිතයින්ට පෙන්විය යුතුය. ඡන්ද පෙට්ටිය හිස්ව තිබෙන බව පෙන්විය යුතුය. අලුත් ඡන්ද පෙට්ටියක් පාවිච්චි

කරන සෑම විටම එසේ කළ යුතුය. සෑම ඡන්දපොළකම පහත පහසුකම් සලසා තිබිය යුතුය.

- ❖ ඡන්ද හිමි නාම ලේඛනය
- ❖ තැපැල් ඡන්දදායකයන්ගේ ලැයිස්තුව
- ❖ ඡන්ද දායකයාට ඡන්ද පත්‍රිකා ලකුණු කිරීමට අවශ්‍ය පරිසරය හා උපකරණ (තුන් පැත්තක් ආවරණය කළ ස්ථානය හා ප්‍රමාණවත් ආලෝකය)
- ❖ ආරක්ෂක විධි විධාන
- ❖ මැතිවරණ පනත යටතේ  අවශ්‍ය වෙනත් පහසුකම්

ඡන්ද විමසීම ආරම්භයට පෙර සිට පහත දැන්වීම් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා තුනෙන්ම ඡන්දදායකයන්ගේ පහසුව සඳහා මැතිවරණ නිලධාරීන් විසින් ප්‍රදර්ශනය කිරීමට පියවර ගත යුතුය.

- ❖ අපේක්ෂකයින්ගේ නම් සහ ඔවුන් අයත් පක්ෂයට/ කණ්ඩායමට අදාළ අනුමත කරන ලද ලකුණු සහ අංක
- ❖ ඡන්ද දායකයන්ට මග පෙන්වන  උපදෙස්සහ ආදර්ශ ඡන්ද පත්‍රිකාවන්

2. ඡන්ද විමසීම් ආරම්භ කිරීම

මැතිවරණ දිනයේ පෙරවරු 7. 00 ට ඡන්ද විමසීම ආරම්භ කළ යුතුය. ඡන්දදායකයාගේ අනන්‍යතාව තහවුරු කිරීම ප්‍රථමයෙන් කළ යුතුවේ. 2004අංක 14 දරණ පාර්ලිමේන්තු පනත හා මැතිවරණ කොමසාරිස්වරයාගේ ගැසට් නිවේදනය අනුව අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත වෙනුවට පහත ලේඛන නීත්‍යානුකූලව භාවිත කළ හැකිය.

- ❖ සහකාර නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස්වරයාගේ අනුමැතිය මත නිකුත් කරනු ලබන තාවකාලික හැඳුනුම්පත
- ❖ වැඩිහිටි (ජ්‍යෙෂ්ඨ පුරවැසි) හැඳුනුම්පත
- ❖ වලංගු විදේශ ගමන් බලපත්‍රය
- ❖ විශ්‍රාමික හැඳුනුම්පත
- ❖ පූජ්‍ය/පූජක හැඳුනුම්පත

- ❖ වලංගු රියදුරු බලපත්‍රය

ඡන්ද දායකයාගේ අංකය, නම හඬ නගා කියවිය යුතුය. අංකය උප පත්‍රිකාවේ යොදා පත්‍රිකාව වෙන් කළ යුතුය. නිල ලකුණෙන් එහි මුද්‍රා තැබිය යුතුය. නැතහොත් සිදුරු කළ යුතුය. ඡන්දදායක නාමලේඛනයෙහි පත්‍රිකාව දුන් බවට ලකුණක් දැමිය යුතුය. එහෙත් ඒ ලකුණෙන් ඔහුට දුන් නිශ්චිත පත්‍රිකාව කුමක්දැයි දැන ගැනීමට ඉඩ නොතැබිය යුතුය.

ඡන්දදායකයාගේ වම් සුළැඟිල්ලෙහි නිසි පරිදි තීන්ත ආලේප කළ යුතුය. සුළැඟිල්ලක් නොමැතිනම් වෙනත් ඇඟිල්ලක්ද, වම් අතේ ඇඟිලි නොමැතිනම් දකුණු අතේ ඇඟිල්ලක්ද, එසේත් නැත්නම් අතෙහි කෙළවර තීන්ත ආලේප කිරීම කළ හැකිය.තීන්ත ආලේප කිරීමට ඡන්දදායකයාට විරුද්ධ විය නොහැකිය. තීන්ත ආලේපනොකළඡන්ද හිමියෙකුට ඡන්ද පත්‍රිකාව නොදිය යුතුය.යම් ඡන්ද දායකයෙකු ඉල්ලා සිටියහොත් ඡන්දය දීමේ ක්‍රමය ඔහුට පහදා දිය යුතුය. ස්ථානාධිපති මගින් හෙවත් අදාළනිලධාරියෙකු විසින් එම උපදෙස් ඡන්ද මධ්‍යස්ථාන නියෝජිතයන්ට ඇසෙනසේ පහදා දිය යුතුය. අබල දුබල හෝ අන්ධ කෙනෙකු විසින් ඔහුට හෝ ඇයට අවශ්‍ය ආකාරයට ඡන්දලකුණු කළ යුත්තේ තවත් නිලධාරියෙකු ඉදිරිපිටදීය.

ඉහත අවස්ථාවලදී ඡන්ද මධ්‍යස්ථාන නියෝජිතයා පරීක්ෂාවෙන් සිටිය යුතුය. ඉහත සඳහන් කරුණු නිසි සේ ඉටු නොවන විට ස්ථානාධිපතිට පැමිණිලි කොට තමන් වෙතද ඒ පිළිබඳව සටහන් තබා ගැනීම ඡන්ද මධ්‍යස්ථාන නියෝජිතයෙකුට කළහැකිය.

යම් ඡන්දදායකයෙකුගේ නම ඡන්ද හිමි නාම ලේඛනයේ ඇති නම් ඔහුට ඡන්ද පත්‍රිකාවක් ඉල්ලා සිටීමට හා ලැබීමට සම්පූර්ණ අයිතිය ඇත.ඡන්ද දායකයෙකුට ඡන්ද පත්‍රිකාවක් නිකුත් නොකර සිටීමට ස්ථානාධිපතිවරයෙකුට හැකි වන්නේ පහත හේතුන් මත පමණි.

- ❖ අනන්‍යතාව තහවුරු නොකිරීම.
- ❖ යම් ඡන්ද දායකයෙකුගේ සුළැඟිල්ල පරීක්ෂා කොට බැලීමේදී එහි නොමැකිය හැකි තීන්ත ලකුණු තිබේද යන්න සොයා බැලීමට ස්ථානභාර නිලධාරියාට හෝ ඔහුගේ නියෝජිතයෙකුට ඉඩ නොදීම.
- ❖ එවැනි පරීක්ෂණයකින් තීන්ත ලකුණු තිබෙන බව අනාවරණය වීම.
- ❖ නොමැකෙන තීන්ත සුළැඟිල්ලේ තැවරීමට ඉඩ නොදීම.

යම් ඡන්ද ඡන්ද දායකයෙකු විසින් තමන්ට නිකුත් කරන ලද ඡන්ද පත්‍රිකාව ප්‍රමාද දෝෂයකින් නිසියාකාරව පාවිච්චි නොකළහොත් එම නරක් වූඡන්ද පත්‍රිකාව ස්ථානාධිපතිට භාර දී ඒ වෙනුවට වෙනත් ඡන්ද පත්‍රිකාවක් ලබා ගත හැකියි. ඡන්දදායකයෙකු ඡන්ද පත්‍රිකාවක් ඉල්ලා සිටි විට ඔහුගේ නමින් ඡන්ද පත්‍රිකාවක් වෙනත් අයෙකුට නිකුත් කර ඇත්නම් එය ප්‍රකාශනයක් ලෙස අත්සන් කර ද්විත්ව පත්‍රිකාවක් ලබා ගත හැකිය. නමුත් එය විශේෂ අවස්ථාවකදී හැර ගණන් කරන්නේ නැත.

3. ඡන්ද මධ්‍යස්ථාන නියෝජිතයින්

ඡන්ද දිනයේදී නියෝජිතකමට පත් කිරීමේ ලිපිය ඉදිරිපත් කළ යුතුය. එම ලිපිය ලබා ගත යුත්තේ,

- ❖ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්, නැතහොත් ලේකම්ගේ බලයලත් නියෝජිතයා, ස්වාධීන කණ්ඩායමක් නම් එහි නායකයා යන එක් අයෙක්ගෙනි.
- ❖ එම පත්වීම් ලිපියෙහි නියෝජිතයාගේ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් විය යුතුය. හැඳුනුම්පත රැගෙන ආ යුතුය.
- ❖ පත්වීම් ලිපි නිකුත් කිරීමට බලය ඇති තැනැත්තා ගැන ඡන්ද දින 07 කට පෙර තේරීම් භාර නිලධාරියාට දැනුම් දී තිබිය යුතුය.
- ❖ ඡන්ද පොළ නියෝජිතයකුගෙන් පත්වීම් අවලංගු කර අලුත් නියෝජිතයෙකු පත් කිරීම සඳහා ඉහත තොරතුරු සහිතව ලිඛිතව කළ යුතුය.
- ❖ එක් පක්ෂයක් හෝ කණ්ඩායමක් වෙනුවෙන් ඡන්ද මධ්‍යස්ථානයක නියෝජිතයින් දෙදෙනෙකුට වඩා රැඳී සිටිය නොහැකිය.

ඡන්ද ස්ථානාධිපතිවරයාට ඡන්ද පොළේ යහපත් පැවැත්ම රැකගැනීමට අවශ්‍ය සහයදිය යුතුය. ඡන්ද මධ්‍යස්ථානයේ රැඳී සිටීමට බලය ඇති අය හැර අනෙක් අය බැහැර කළ හැකිය. එහෙයින් වෙනත් අය පැමිණෙන විට බැහැර කිරීමට මතක් කළ හැකිය.

4. ඡන්ද කටයුතුවල යෙදෙන නිලධාරීන්, නියෝජිතයින් සම්බන්ධ වගකීම් හා යුතුකම්

ඡන්ද මධ්‍යස්ථානයේ හෝ ගණන් කරන මධ්‍යස්ථානයේ ඡන්ද කටයුතුවල යෙදෙන නිලධාරීන්ගේ නියෝජිතයන් එම ස්ථානයට පැමිණීමට බලය දෙනු ලැබූ නිලධරයින්,

ලිපිකරුවන්, අපේක්ෂකයින්, නියෝජිතයින් විසින් රහස්‍යතා ප්‍රකාශයට අත්සන් කළ යුතුය.

- ❖ රහස්‍ය බව රැකීමත්, රැකීමට උදව්වීමත් ඔවුන් විසින් කළ යුතුය.
- ❖ ඡන්දදායකයෙකුගේ නම හෝ අංකය හෝ නිල ලකුණක් ගැන නීතියේ සඳහන් පරිදි හැර, කිසිවෙකුට දැනුම් දීම නොකළ යුතුය.
- ❖ ඡන්දය දෙන හෝ දී ඇති පක්ෂය හෝ කණ්ඩායම හෝ ඡන්ද පත්‍රිකාවේ පිට පැත්තේ අංකය හෝ දැනුම් දීම නොකළ යුතුය.

ඡන්ද මධ්‍යස්ථානයේදී ඡන්දය දැමීමට පෙර ඡන්දදායකයා සමඟ කතාබහ නොකළ යුතුය. මේ යටතේ වැරදිකරුවෙකු වුවහොත් රුපියල් 500/= ක දඩයක් හෝ මාස හයක සිර දඬුවමක් නියම විය හැකිය. අවුරුදු 07 කට ප්‍රජා අයිතියද අහෝසි වේ.

ඡන්ද මධ්‍යස්ථානයට ඇතුළු විය හැක්කේ පහත සඳහන් අයට පමණි.

- ලියාපදිංචි ඡන්ද දායකයින් ඡන්ද දීම සඳහා පමණක්
- ඡන්ද මධ්‍යස්ථානයට අවශ්‍ය කාර්ය මණ්ඩලය
- එහි රාජකාරි නියමිත පොලිස් නිලධාරීන්
- ක්ෂේත්‍ර කටයුතු සඳහා පැමිණෙන තේරීම් භාර නිලධාරීන්
- හැඳුනුම්පත හා පත්වීම් ලිපිය ඇති ඡන්ද මධ්‍යස්ථාන නියෝජිතයන්
- අපේක්ෂකයන් (එක් වරකට මධ්‍යස්ථානය තුළ සිටිය හැක්කේ එක් අයකුට පමණි)
- තරඟ කරන දේශපාලන පක්ෂවල ලේකම්වරුන් ස්වාධීන කණ්ඩායම් නායකයන්
- පිළිගත් නිරීක්ෂණ සංවිධානනියෝජිතයන් ඡන්දය නිරීක්ෂණය කිරීමසදහා

ඉහත සඳහන් නොවන වෙනත් අය ඇතුළු වීම දඬුවම් ලැබිය හැකි වරදකි .

5. ඡන්දය අවසන් කිරීම

පෙරවරු 7.00 ට ආරම්භ කර ඡන්ද විමසීම සවස 4.00ට අවසන් කළ යුතුය. එනම්, ඡන්ද පත්‍රිකා නිකුත් කිරීම අවසන් කළ යුතුය. සෑම ඡන්ද ස්ථානාධිපතිවරයෙකු විසින්ම ඡන්ද විමසීම කළ වහාම ඡන්ද අපේක්ෂකයන් හා ඔවුන්ගේ ඡන්ද පොළ නියෝජිතයන් ඉදිරිපිටදී තමන්ගේ මුද්‍රාවද, ඡන්ද අපේක්ෂකයන්ගේ හෝ ඔවුන්ගේ

ඡන්දපොළ නියෝජිතයන්ගේ මුද්‍රාවන් ඔවුන් කැමති නම් යොදා පහත සඳහන් දේ මත මුද්‍රා තැබිය යුතුය.

- පාවිච්චි නොකළ හා නරක් වූ ඡන්ද පත්‍රිකා මිටියකට ද
- ලකුණු කරන ලද ඡන්ද දායක නාමාවලියේ පිටපත් සහ ඡන්ද පත්‍රිකාවල උප පත්‍රිකා ද
- ද්වීතීය ඡන්ද නාමාවලිය ද
- ඡන්ද පත්‍රිකා නොදෙන ලද ඡන්ද දායකයන්ගේ නාමාවලිය

ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් විවෘත නොකළ ඡන්ද පෙට්ටිය තමාගේම මුද්‍රාව තැබීමට කැමැත්ත දක්වන අපේක්ෂකයන්ගේ හෝ ඔවුන්ගේ ඡන්ද විමසීම් නියෝජිතයන්ගේ මුද්‍රාවන්ද යොදා මනා සේ වසා ඡන්ද තේරීම්භාර නිලධාරියාට සුරක්ෂිතව යැවිය යුතුය. මෙයින් අදහස් කරන්නේ ඡන්ද ගණන් කරන ස්ථානයමය.ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් ඉහත දැක්වූ පැකට්ටු සහ ඡන්ද පෙට්ටිය හෝ ඡන්ද පෙට්ටි සමග එම ඡන්ද ස්ථානාධිපතිවරයාට භාරදීම, ලද නිලමය හැඳින්වීම් පත්‍රිකාවලට අනුපිටපත් හා එම ඡන්ද ස්ථානභාර නිලධාරියාට භාර දෙන ලද ඡන්ද පත්‍රිකා ගණන් පහත දැක්වෙන ප්‍රකාශයක්ද ඡන්ද තේරීම්භාර නිලධාරීන්ට බාර දෙන ලද ඡන්ද පත්‍රිකා ගණන් පහත දැක්වෙන ප්‍රකාශනයක් ද ඡන්ද තේරීම්භාර නිලධාරියා සැපයිය යුතුය .

- නරක් වූ ඡන්ද පත්‍රිකා හැර ඡන්ද දායකයන්ට නිකුත් කරන ලද ඡන්ද පත්‍රිකා
- නරක් වූ ඡන්ද පත්‍රිකා
- පාවිච්චි නොකළ ඡන්ද පත්‍රිකා

6. යම් ඡන්ද මධ්‍යස්ථානයක ඡන්ද විමසීම් ශූන්‍ය කිරීමට බලපා බලපෑ හැකි කරුණු

- පෙරවරු 7 ට නියමිත පරිදි ඡන්ද පොළ විවෘත නොකිරීම.
- පස්වරු හතරට නියමිත පරිදි ඡන්ද විමසීම අවසන් නොකිරීම.
- සියුලු ඡන්ද පෙට්ටි ඡන්ද මධ්‍යස්ථානයේ සිට ගණන් කිරීමේ නිලධාරියාට භාරදීමේ අරමුණු ඇතිව නිසි පරිදි ප්‍රවාහන ආරම්භ නොකිරීම.
- ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිට පාලනය කළ නොහැකි කුමන හෝ හේතුවක් නිසා ඡන්ද විමසීම් පවත්වාගෙන යාමට නොහැකි වීම.

- ඡන්ද විමසීමේ කාලය තුළදී යම් ඡන්ද ඡන්දපොළ නියෝජිතයෙකුට /නියෝජිතයන්ට තර්ජනය කිරීම පහරදීම හෝ ඡන්ද පොළෙන් පලවා හැරීම.
- ඡන්ද විමසීම පවත්වාගෙන යාමට නොහැකි ලෙස ඡන්ද මධ්‍යස්ථානයේ සාමය කඩවීම .

මේ පිළිබඳ මැතිවරණ කොමසාරිස්වරයා විසින් පහත සඳහන් නිලධාරීන් පුද්ගලයන් විසින් සපයනු ලබන වාර්තා එකක් හෝ කිහිපයක් මත තීරණය කරන ගැසට් නිවේදනයක් පළ කරනු ලබයි. කිසියම් ඡන්ද පොළක ඡන්දය අවලංගු කරනු ලැබුවහොත් නැවත එම මධ්‍යස්ථානය සඳහා ඡන්ද විමසීමක් පවත්වනු ලබයි .

- ❖ ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති
- ❖ තේරීම්භාර නිලධාරී/ අතිරේක තේරීම්භාර නිලධාරීන්
- ❖ ඡන්ද පොළ නියෝජිතයන්
- ❖ රාජකාරියේ/ සේවයේ නියුක්තව සිටි පොලිස් නිලධාරීන්
- ❖ ස්වාධීන මැතිවරණ නිරීක්ෂකයින්

7. ඡන්දය ගණන් කිරීම

අදාළ තේරීම්භාර නිලධාරියා විසින් මැතිවරණ කොට්ඨාසයට සම්බන්ධ ඡන්ද පෙට්ටි සියල්ල ලැබීමෙන් පසුව හැකිතාක් ඉක්මනින් ගණන් කිරීමේ කටයුතු ආරම්භ කළ යුතුය. ඡන්ද ගණන් කරන වේලාව සහ ස්ථානය අපේක්ෂකයන්ට සහ නියෝජිතයන්ට ලියවිල්ලකින් දැනුම් දිය යුතුය. ගණන් කරන විට ඡන්ද පත්‍රිකාවේ මුහුණත උඩුකුරුව තැබිය.එහි අංකය පෙනෙන සේ තැබිය යුතුය.ඡන්දය ගණන් කිරීම අඛණ්ඩව කළ යුතු ය.අවලංගු ඡන්ද පත්‍රිකා 'අවලංගු කරන ලදී' යැයි පිටසන් කළ යුතුය.ගණන් කරන විට අදාළ නිලධාරීන්ට හානියෝජිතයන්ට සහ අවසර ලත් සංවිධාන නියෝජිතයන්ට පමණක් එහි සිටිය හැක.මෙහිදී ගණන් කිරීමේ නියෝජිතයින් එම ඡන්ද පෙට්ටි නිසි පරිදි තිබේදැයි සහ අනෙක් කටයුතු නිසි පරිදි සිදු වේ දැයි බලා සිට එසේ සිදු නොවන්නේ නම් එම ස්ථානභාර ප්‍රධානියාට පැමිණිලි කළ යුතුය.

ඡන්ද පත්‍රිකා මිටි බඳින විට නියමිත පත්‍රිකා පමණක් ගොනු කරනවාද, 50 සහ 500 මිටි ලෙස සකස් වේ දැයි නියෝජිතයා විසින් පරීක්ෂා කළ යුතුය. ඡන්ද පත්‍රිකාවක් මුද්‍රා තබා හෝ සිදුරු නොකර ඇති විට එය ප්‍රතික්ෂේප නොකරනු ඇත.

එහෙත් නියෝජිතයින්ගෙන් ද ඒ ගැන අදහස් විමසනු ඇත. නිසි අදහසක් දිය යුතුය.ඡන්ද පත්‍රිකාවක් ප්‍රතික්ෂේප කිරීමට පෙර එය ද නියෝජිතයන්ට පෙන්වා අදහස් විමසනු ඇත.ප්‍රතික්ෂේප කරන ලද ඡන්ද පත්‍රිකා ගණන් වෙන වෙනම දැක්වෙන ප්‍රකාශනයක් සකස් කෙරේ.එය අත්‍යවශ්‍ය නම් නියෝජිතයකුට පිටපත් කර ගත හැකිය.

එක් එක් පක්ෂවලට හෝ කණ්ඩායම්වලට දෙන ලද ඡන්ද සංඛ්‍යාව පිළිබඳ ලිඛිත ප්‍රකාශනයක් සැකසේ.එයට නියෝජිතයන්ද අත්සන් කළ හැකි අතර ඔවුන්ට එය පිටපත් කර ගැනීමටද හැකිය. ගණන් කිරීමේ නියෝජිතයකුට උපරිම වාර දෙකක් නැවත ගණන් කිරීමක් සඳහා ඉල්ලීමක් කළ හැකිය.ඡන්ද පත්‍රිකාවක් ගැන පැන නැගෙන ප්‍රකාශනයක් ගැන අවසාන තීරණය ගණන් කිරීමේ නිලධාරියා සතුය.

ඡන්ද ගණන් කිරීමේ දී ප්‍රතික්ෂේප කළ යුතු ඡන්ද පත්‍රිකා කිහිපයක් ඇත. එනම්,

1.නිල ලකුණ නොමැති ඡන්ද පත්‍රිකා

2.පිළිගත් දේශපාලන පක්ෂ එකකට වැඩි ගණනකට ඡන්ද සටහන් කර ඇති පත්‍රිකා

3.ස්වාධීන කණ්ඩායම් එකකට වැඩි ගණනකට ඡන්ද සටහන් කරඇති ඡන්ද පත්‍රිකා

4.පිළිගත් දේශපාලන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් දෙකකට හෝ ඊට වැඩි ගණනකට සංකල්පයකට ඡන්ද සටහන් කර ඇති ඡන්ද පත්‍රිකා

5.පිට පැත්තෙහි ඇති මුද්‍රිත අංකය හැර ඡන්ද දායකයා හඳුනාගත හැකි යම් දෙයක් ලියන ලද හෝ ලකුණු කරන ලද ඡන්ද පත්‍රිකා

6.ලකුණු නොකරන ලද ඡන්ද පත්‍රිකා

7.ඡන්දය දෙන ලද පිළිගත් දේශපාලන පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම හෝ සම්බන්ධයෙන් වූ අවිනිශ්චිතභාවය නිසා අවලංගු වන්නාවූ ඡන්ද පත්‍රිකා

8.ඡන්ද ගණන් කරන ස්ථාන නියෝජිතයෝ

ගණන් කරන ස්ථාන සඳහා නියෝජිතයින් පත් කළ යුත්තේ පක්ෂයේ ලේකම් බලය ලත් නියෝජිතයා හෝ කණ්ඩායම් නායකයා විසිනි.

- එක් මධ්‍යස්ථානයක ගණන් කරන ස්ථාන එකට වඩා ඇති විට පස් දෙනෙකුටද,
- ගණන් කරන ස්ථාන එකක් පමණක් ඇති විට දෙදෙනෙකුට ද

නියෝජිතයන් වශයෙන් පත් කළ හැකි ය.

ගණන් කිරීමේ නියෝජිතයන්ගේ නම් සහ ලිපිනයන් කල් ඇතිව ගණන් කිරීමේ නිලධාරියාට දැනුම් දී තිබිය යුතුය. ගණන් කරන අවස්ථාවේදී ජාතික හැඳුනුම්පත සමග පත්වීමේ ලිපිය ද රැගෙන යා යුතුය.එම අවශ්‍යතා නැත්නම් ඇතුළු වීම ප්‍රතික්ෂේප කළ හැකිය.

9. ඡන්දය දීමට යාම සඳහා නිවාඩු ලබා ගැනීම

ඡන්දය දීමට යාම සඳහා ඡන්ද හිමි සේවකයෙකු විසින් ලිඛිතව ඉල්ලුම් කළ විටදී ඒ සඳහා පැය හතරකට නොඅඩු අඛණ්ඩ කාලයක් වැටුප් සහිත නිවාඩු දීමට සෑම සේවායෝජකයෙක් ම බැඳී සිටි .

## <u>මැතිවරණ වැරදි</u>

1981 අංක 01 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත යටතේ දඬුවම් ලැබිය හැකි වැරදි වර්ග තුනක් දක්වා ඇත.

- ඡන්ද වැරදි (පනතේ වගන්ති 66-76)
- දූෂණ ක්‍රියා (පනතේ වගන්ති 77-82)
- නීති විරෝධී ක්‍රියා (පනතේ වගන්ති වගන්තිය 83-90)

**ඡන්ද වැරදි**

1. මැතිවරණයට පෙර තහනම් ක්‍රියා.

**66 වගන්තිය**

- නාම යෝජනා පත්‍රයක් කූඨ ලෙස පිළියෙල කිරීම, ඡන්ද පත්‍රිකාවක නිල ලකුණ කූඨ ලෙස සකස් කිරීම, හොර ඡන්ද පත්‍රිකා සකස් කිරීම ඒවා වංචනික ලෙස විරූපී කිරීම හෝ විනාශ කිරීම.

- ❖ එසේ බලය නොමැතිව ඡන්ද පත්‍රිකා සැපයීම, විකිණීම, මිලදී ගැනීම, නිල ලකුණ සහිත ඡන්ද පත්‍රිකාවක් තමන් වෙන්ව තබාගැනීම, ඡන්ද පොළෙන් පිටතට රැගෙන යාම.
- ❖ ලකුණු කළ ඡන්ද පත්‍රිකාවක් ඡන්ද පොළක් තුළ ප්‍රදර්ශනය කිරීම කිරීම ඡන්ද පෙට්ටියට ඡන්ද පත්‍රිකාවක් නොවන වෙනත් දෙයක් දැමීම.
- ❖ බලය නැතිව ඡන්ද පෙට්ටියක්, ඡන්ද පත්‍රිකා පැකැට්ටුවක් තබා ගැනීම, විනාශ කිරීම, විවෘත කිරීම.
- ❖ හොර ඡන්ද පත්‍රිකා මුද්‍රණය කිරීම.
- ❖ පෙට්ටියට ඡන්ද පත්‍රිකා දැමූ පසු ඉවතට ගැනීම හෝ විකෘති කිරීම, ඒ සඳහාඋපකරණ පාවිච්චියට ගැනීම හෝයන්ත්‍ර සූත්‍ර භාවිතා කිරීම එවැනි යන්ත්‍ර ගෙන්වීම.
- ❖ තැපැල් ඡන්දයේදී අනන්‍යතාව ගැන බොරු ප්‍රකාශ කිරීම තැපැල් ඡන්ද පත්‍රිකා කවර නිසි බලය නොමැතිව විවෘත කිරීම හෝ යමක් එකතු කිරීම.
- ❖ නිල ඡන්ද පත්‍රිකා මුද්‍රණය කිරීම, ඡන්දලකුණක් හෝ වරදවා තේරුම් ගත හැකි යමක් තැබීම හෝ විරූප කිරීම.

ඉහත සඳහන් කළ වැරදිවලට මහාධිකරණය ඉදිරියේ නඩු විභාගයකින් පසු අවුරුදු දෙකක කාලයක් සඳහා බරපතළ වැඩ ඇතිව හෝ නොමැතිව සිර දඬුවමක් ලැබිය හැකිය. තවද අවුරුදු හතකට ප්‍රජා අයිතිවාසිකම් නැති කළ හැකිය.අදාළවරදකරුවන්ට දඬුවම් ලැබූ පුද්ගලයා මන්ත්‍රීවරයෙකු ලෙස තේරී පත් වී සිටියහොත් මන්ත්‍රි ධුරය අහිමි වෙයි.

2.ඡන්දය විමසන දිනයේ තහනම් ක්‍රියා.

**68 වගන්තිය.**

ඡන්දපොළට කිලොමීටර් භාගයක සීමාව ඇතුළත පහත සඳහන් දේ කිරීම වරදකි .

- ❖ ඡන්දය ආයාචනය කිරීම
- ❖ යම් ඡන්ද හිමියෙකුගේ ඡන්දය ඉල්ලීම
- ❖ ඡන්දය දෙන ලෙස පුද්ගලයන්ට කීම, ප්‍රසිද්ධියේ ඇමැතීම, දේශපාලන පක්ෂයට හෝ ස්වාධීන කණ්ඩායමකට ඡන්දය නොදෙන ලෙස පෙළඹවීම.

- ඡන්ද විමසීම හා සම්බන්ධයෙන් අත් පත්‍රිකාවක්, ප්‍රදර්ශන පත්‍රයක්, දැන්වීමක්, චිත්‍රයක්, ඡායාරූපයක් හෝ පිළිගත් පක්ෂයකට හෝ කණ්ඩායමකට අයත් ලකුණක් බෙදාහැරීම ප්‍රදර්ශනය කිරීම (නිල පත්‍රිකා සහ දැන්වීම් ආදියෙන් මේ ගණයට නොවැටේ).
- ඡන්ද පොළට පැමිණෙන අයට රාජකාරි කරන නිලධාරීන්ට හෝ වෙනත් අයගේ වැඩට බාධා වන පරිදි ඡන්ද පොළ අසල හෝ ඇතුළත ශබ්ද විකාශන යන්ත්‍ර පාවිච්චි කිරීම කෑගැසීම අසංවර ලෙස හැසිරීම.
- ඉහත වැරදි සඳහා මහේස්ත්‍රාත් මහේස්ත්‍රාත් අධිකරණයකින් ලඝු නඩු විභාගයකින් වැරදිකරුවෙකු කරනු ලැබූ විට රුපියල් සීයක දඩයකට හෝ මාස 1 ක සිර දඬුවමකට හෝ එම දඬුවම් දෙකටම යටත් කළ හැකි ය .

3. පෙරහැරවල් පෙළපාලි හා ප්‍රසිද්ධ රැස්වීම්.

**69 වගන්තිය**

නාමයෝජනා දෙනු ලැබූ දින සිට ප්‍රතිඵල නිකුත්වීමෙන් සතියක් පසුවන දින දක්වා පෙරහැරවල්, පෙළපාලි මෙහෙයවීම් පැවැත්වීම සහභාගිවීම තහනම්ය. ඡන්දයට උදව් කරන ක්‍රියාවක් නොවන අයුරින් මැයි දින පෙරහැර පමණකර පමණක් පැවැත්විය හැකි වන අතර මැතිවරණයට අනුබල නොදෙන අයුරින් ආගමික හා සාමාජීය කාර්යය සඳහා පෙරහැරවල් පැවැත්වීමට හැකි වේ.මෙය උල්ලංඝනය කළහොත් දඬුවම් මාසයක මාසයක සිරදඬුවම් හෝ රු.100/=දඩය හෝ මේ දෙකම වශයෙන් වේ.

**70 වගන්තිය**

ඡන්දය දෙන්නට දෙදිනකට පෙර සිට ප්‍රතිඵල නිකුත් වී සතියක් යනතෙක් ප්‍රසිද්ධ රැස්වීම් තහනම්ය. දඩය රුපියල් සීයක් වන අතර මාස දෙකකට නොවැඩි සිර දඬුවමකට ලක් විය හැකියි.

**71 වගන්තිය**

ඉහත වැරදි සිදු කිරීමට තැත් කිරීම සම්බන්ධයෙන් ද දඬුවම් එයමය. එය මෙම වැරදි වලට සැක කර වරෙන්තු නොමැතිව අත්අඩංගුවට ගත හැක. එහෙත් 66, 67, 68, 69 සහ 70 යන වගන්ති යටතේ කෙරෙන ඡන්ද වැරදි සඳහා සඳහා නඩු පැවරීමට නීතිපතිවරයාගේ අනුමැතිය මහේස්ත්‍රාත් අධිකරණයේ දී වරදකරු කරනු ලැබූ විට

රුපියල් සීයක දඩයක් හෝ එක් මාසයක් සිර දඬුවම් නියම කිරීම හෝ දඬුවම් දෙකම අයත් වේ.

4. කාර්යාල පැවැත්වීම.

**73 වගන්තිය**

නාම යෝජනා කාල සීමාවේ පළමු දින සිට ඡන්ද විමසීම් දිනයට පෙර දින දක්වා කාලය ඡන්ද කටයුතු සඳහා කාර්යාලය පවත්වාගෙන යා හැක්කේ පහත පරිදිය.

- ❖ බලයලත් නියෝජිතයෙකුට හෝ කණ්ඩායම් නායකයෙකුට යම් මැතිවරණ කොට්ඨාසයක එක් මධ්‍ය මැතිවරණ කාර්යාලයක් සහ එක් එක් ඡන්ද කොට්ඨාශයේ එක් ශාඛා කාර්යාලය බැගින් පවත්වාගෙන යා හැකිය. (73- 1(අ) වගන්තිය).
- ❖ එක්එක් අපේක්ෂකයා වෙනුවෙන් ශාඛා මැතිවරණ කාර්යාලය බැගින් (73- 1(අ) වගන්තිය).
- ❖ කණ්ඩායම් නායකයෙකුගේ හෝ අපේක්ෂකයෙකුගේ සාමාන්‍ය පදිංචි නිවස මැතිවරණ කාර්යාලයක් ලෙස පාවිච්චි කළ හැකිය. (73 -2 (ආ) වගන්තිය). මෙම ශාඛා කාර්යාලය පිහිටුවන බව ප්‍රදේශයේ පොලිස් ස්ථානභාර නිලධාරියාට දැනුම් දිය යුතුය. (73-6 (අ) වගන්තිය). මෙම වගන්තිය යටතේ වූ වරදක් සම්බන්ධයෙන් නඩු පැවරීමට නීතිපතිවරයාගේ අනුමැතිය අවශ්‍යය.

5. අත් පත්‍රිකා දැන්වීම් කොළ ආදිය ප්‍රදර්ශනය කිරිම.

**74 වගන්තිය**

අත්පත්‍රිකා, දැන්වීම් කොළ නාමයෝජනා දින සිට ඡන්දය විමසන දිනට පසුදා තෙක් ඡන්දය විමසීම ගැන අනුබල දීම සඳහා අපේක්ෂකයාගේ වාහන හැර වෙනත් වාහනයක කොඩියක්, පතාක දැන්වීමක්, ඡායාරූපයක් ලකුණ ප්‍රදර්ශනය නොකළ යුතුය. මහා මාර්ගයක එසේ ප්‍රදර්ශනය කිරීම වරදකි.

යම් අපේක්ෂකයෙකුට ආධාර වශයෙන් රැස්වීමක් පැවැත්වෙන ස්ථානයක එම දිනයේ දී හැර,

- මිනිස්සුන්ට යාමට අයිති ඇති හෝ ඉඩ ඇති ස්ථානයක යම් අත්පත්‍රිකාවක් ප්‍රදර්ශන පත්‍රයක් දැන්වීම් කාලයක් චිත්‍රයක් දැන්වීමක් අපේක්ෂකයෙකුගේ ඡායාරූපයක් ලකුණක් හෝ සලකුණක් ප්‍රදර්ශනය කිරීම තහනම් වේ.
- යම් පාරක් හරහා හෝ මහා මාර්ගයේ යම් අත්පත්‍රිකාවක් ප්‍රදර්ශන පත්‍රයක් දැන්වීම් කොළයක් චිත්‍රයක් චිත්‍රයක් දැන්වීමක් අපේක්ෂකයෙකු ඡායාරූපයක් ලකුණක් සලකුණක් කොඩියක්. පතාක දැන්වීමක් ප්‍රදර්ශනය කළ නොකළ යුතුය.
- යම් පොදු හෝ පෞද්ගලික කවර ස්ථානයක හෝ කොඩියක් හෝ පතාකයක් හෝ ප්‍රදර්ශනය නොකළ යුතුය.

මහේස්ත්‍රාත් අධිකරණයේදී වරදකරු කරනු ලැබූ විට දඬුවම රු 100 ක දඩයක් හෝ බරපතල වැඩ සහිතව හෝ රහිතව මාසයක කාලයක සිර දඬුමක් හෝ දඩය හා සිර දඬුවම දෙකම වේ. හෝ තැත් කිරීම් ගැන කිරීම ගැන සැක පිට වරෙන්තුවක් නොමැතිව අත්අඩංගුවට ගත හැකිය. ඒවා වැළැක්වීමට පොලිස් නිලධාරීන්ට බලය පාවිච්චි කළ හැකිය. එම වැරදි වැළැක්වීමට මහේස්ත්‍රාත් අධිකරණයෙන් ඉල්ලීමක් කළ යුතුය. එම නීති විරෝධය දැන්වීම්, පතාක සහ පත්‍රිකා ඉවත් කිරීම කිරීමට බලය ඇත.

**75 වගන්තිය**

නාම යෝජනා අවසන් දින සිට ඡන්ද විමසීම් දිනයට පසුදින දක්වා ඡන්ද අපේක්ෂක, ඡන්ද අපේක්ෂකයාගේ හෝ ඔහුගේ පවුලේ කෙනෙකු පවුලේ අය සැමියා, බිරිඳ, දුව, පුතා, පුතාගේ බිරිඳ, පහත සඳහන් දේ කිරීම වරදකි.ඡන්දය ඉල්ලීම සඳහා නිවස්වලට යාම,යම් පක්ෂයකට හෝ අපේක්ෂකයෙකුට මේ මැතිවරණයේදී ඡන්දය නොදෙන ලෙස පෙළඹවීම, අත් පත්‍රිකා, ප්‍රදර්ශන පත්‍රිකා, දැන්වීම්, චිත්‍ර, ඡායාරූප ලකුණු ප්‍රදර්ශනය කිරීම හෝ බෙදා හැරීම. ඒ සඳහාදඬුවම රු.100 ක දඩයක් හෝ බරපතල වැඩ සහිතව හෝ රහිතව මාසයක කාලයක සිර දඬුවමක් හෝ දඩය හා සිර දඬුවම දෙකම වේ.

**67 වගන්තිය**

ප්‍රජා අයිතිවාසිකම් අහිමි වූවෙකු හෝ වෙනත් අය වෙනුවෙන් ඡන්දය ඉල්ලීම, කතා කිරීම, නියෝජනය කිරීම, මැතිවරණයක දී කවර ආකාරයකින් හෝ සහභාගි වීම වරදකි. දඩය රු. 1000/=කි. සිර දඬුවම මාස හයයි.

6. රහස්‍යතාව

**76 වගන්තිය**

ඡන්ද පොලේදී, ගණන් කරන ස්ථානයේදී නිලධාරීන්,ලිපිකරුවන් හා නියෝජිතයින් පළමුව රහස්‍යතා ප්‍රකාශයකට අත්සන් කළ යුතුය.

> ''අංක...... දරන මැතිවරණ කොට්ඨාසය සඳහා යම් ඡන්ද විමසීමකදී මට කියවා දෙන ලද 1981 අංක 01 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 76 වගන්තියෙන් තහනම් කරනු ලැබ ඇති කිසිවක් නොකරන බවට මම ගාම්භීරතා පූර්වකව පොදුවේ ප්‍රකාශ කරමි. ''

මේ වගන්තියට අනුව මෙම ක්‍රියා තහනම් වේ.

- ❖ ඡන්දය පිළිබඳව අසත්‍යතාවය රැක ගැනීමට ආධාර කළ යුතු අතර ඡන්ද පත්‍රිකාවක් සඳහා ඉල්ලුම් කර ඇති හෝ නැති ඡන්දය පත්‍රිකාවක් දී ඇති යම් ඡන්ද හිමියෙකුගේ නම, අංකය හෝ නිල ලකුණ ගැන යම් තොරතුරක් ඡන්ද විමසීම අවසන් කිරීමට පෙර එළි කිරීම.
- ❖ යම් ඡන්දදායකයෙකු ඡන්දය දුන්නේ කාටද යන වග හෝ ඡන්ද පත්‍රිකාවේ පිට පැත්තේ අංක පිළිබඳව ලබාගත් තොරතුරුත් කිසිවෙකුට කිසිම අවස්ථාවකදී දැනුම් දීම වරදකි.
- ❖ ඡන්දය දී ඇති ඡන්දය දීමට යන පක්ෂය හෝ කණ්ඩායම ගැන තොරතුරු කිසිවෙකුට දීම.
- ❖ ඡන්දදායකයෙකු ඡන්ද පත්‍රිකාවක් ලැබීමෙන් පසු එය ඡන්ද පෙට්ටියට දැමීමට පෙර ඔහු සමග කතා බහ කිරීම හෝ තැත් කිරීම දඩය රුපියල් 500යි. සිර දඬුවම මාස හයයි.ප්‍රජා අයිතිවාසිකමද අහිමි වේ.

**දූෂණ ක්‍රියා**

01. හොර ඡන්ද දැමීම.

**77 වගන්තිය**

ජීවත්ව සිටින හෝ මියගිය කෙනෙකු වෙනුවෙන් පෞද්ගලිකව හෝ තැපෑලෙන් ඡන්ද දීමත් තමාගේ නමින් එක් වරකට වඩා ඡන්දය දැමීම හොර ඡන්ද දැමීම නම් වේ.

මේ සඳහා ඡන්දය දමා තිබීම අවශ්‍ය නැති අතර ඡන්දපොලකින් ඡන්දය දැමීමට ඡන්ද පත්‍රිකාවක් ඉල්ලුම් කිරීම ද ප්‍රමාණවත්ය.තැපැල් ඡන්දය ඉල්ලුම් කිරීම මගින් හෝ තැපැල් ඡන්ද පත්‍රිකාවක් ලකුණු කිරීම මඟින් මෙම වරද සිදුවිය හැකිය. මේ සඳහා වරෙන්තුවක් නැතිව අත්අඩංගුවට ගත හැකිය.

02. සංග්‍රහ කිරීම

**78 වගන්තිය**

මැතිවරණයට පෙර හෝ පසුව හෝ ඒ අතරතුර හෝ ඡන්දය දීම සඳහා සංග්‍රහ කිරීම වරදකි. තමන් විසින්ම හෝ වෙන කෙනකු මාර්ගයෙන් කිරීමද වැරදිය. තවත් අවශ්‍ය වේ.පසුගිය කාලයේ දී නීතිපතිවරයා විසින් බොහෝ සිදුවීම් සඳහා නඩු පැවරීමට අවසර ලබා දී ඇත.කෙනෙකුගේ ඡන්දය ලබා ගැනීම, හෝ ඡන්දය නොදැමීම පිණිස කෙනෙකුට සංග්‍රහ කිරීමද වැරදිය.සංග්‍රහ කිරීමට පහත සඳහන් දේ ඇතුළත්ය.

- කෙලින්ම හෝ වෙනත් මගකින් කෑමක්, බීමක් ,අන්‍ය පානයක් හෝ ආහාර ද්‍රව්‍යයක් දීම හෝ සැපයීම.
- එවැනි දේ ලබාගැනීම පිණිස බලපත්‍රයක් හෝ වෙනත් උපක්‍රමයක් යෙදීම.
- එවැනි දේ සැපයීමට යම් වියදමක් ගෙවීමට පොරොන්දු වීම.
- මෙවැනි සංග්‍රහයක් දීම හෝ සැපයීම මෙන්ම එය ලබාගැනීම හෝ ලැබීමේ උපක්‍රමයක් යෙදීම ද සංග්‍රහ කිරීමේ වරදට අදාළ වේ.

04.ප්‍රචාරක දැන්වීම් හා කාර්යාලය පැවැත්වීම

3. අයුතු බලපෑම්

**79 වගන්තිය**

අයුතු බලපෑම යනු ඡන්ද බලය නිදහසේ පාවිච්චි කිරීමට හෝ නොකිරීමට බාධා කිරීම හෝ පෙළඹවීම වේ. යම් මැතිවරණයක දී ඡන්දය දීමට හෝ නොදීමට පෙළඹවීම හෝ බල කිරීම සඳහා සහ ඡන්දය දී තිබීම හෝ දීමෙන් වැළකී සිටීම නිසා කෙලින්ම හෝ වෙනත් විදියකින් අයුතු බලපෑම් සිදු කළ හැකිය. තමන් විසින් හෝ වෙනත් අයෙකු මගින් යම් තැනැත්තෙකුට හෝ ඔහු වෙනුවෙන් වෙනත් කෙනෙකුට අයිති බලපෑම් කළ හැකිය. බලපෑමක් සාහසික කමක් අවහිරයක් තර්ජනයක් කෙලින්ම හෝ වෙනත් කෙනෙකු මගින් ඇති කළ හැකිය. මේ බලපෑම්වල භෞතික හෝ මානසික පීඩාවක්, පාඩුවක්, හානියක්, සාපයක් කරන බවට තර්ජනය කිරීම, පැහැර ගෙන යන බවට

ඇඟවීම මගින් නිදහස් ඡන්දයට බාධා කිරීම සිදුවේ. නාම යෝජනා දිනයේ සිට ඡන්දය විමසන දිනයට පසුදා දක්වා කාලයේ දී යම් පක්ෂයකට හෝ කණ්ඩායමකට ඡන්දය දීමට හෝ නොදීමට පෙළඹවීම සඳහා ආගමික රැස්වීමකදී කියා සිටිම මෙවැනි ආගමික රැස්වීමකදී මැතිවරණය සඳහා පත්‍රිකා, දැන්වීම්, චිත්‍ර, ඡායාරූප, ලකුණු කාඩ් බෙදාහැරීම හෝ ප්‍රදර්ශනය කිරීම මැතිවරණය යෙදෙන පක්ෂයට හෝ කණ්ඩායමකට ආධාර කිරීම පිණිස පූජනීය ස්ථානයක මහජන රැස්වීමක් පැවැත්වීම අයුතු බලපෑමේ වරද වේ. මැතිවරණ හේතු මත පූජනීය කටයුතු නොකරන බවට තර්ජනය කිරීම හෝ එම ආගමික සංවිධානයෙන් බැහැර කරන බවට තර්ජනය කිරීම අයිති බලපෑම වේ .පක්ෂයකට හෝ කණ්ඩායමකට ඡන්දය දීම හෝ නොදීම පිණිස හෝ ඡන්දය දී තිබීම හෝ ඡන්දය දීමෙන් වැළකී සිටීම නිසා සේවායෝජකයා

- ❖ රැකියාව  අහිමි කිරීම හෝ එසේ කරන බවට තර්ජනය කිරීම.
- ❖ රැකියාවේ යෙදී සිටියදී භුක්ති විඳීමට තිබෙන ප්‍රතිලාභ හෝ සේවා ප්‍රතික්ෂේප කිරීම හෝ එසේ කරන බවට තර්ජනය කිරීම ද අයිති බලපෑම වේ.

4. අල්ලස් දීම

**80 වගන්තිය**

- ❖ ඡන්දය දීම හෝ නොදීම සහ ඡන්ද හිමියකු පෙළඹවීමට දෙන 'දීමනාවකි' එය වක්‍ර මාර්ගයෙන් දීමක් විය හැකිය.ඡන්ද හිමියන් වෙනුවෙන් වෙනත් කෙනෙකුට දෙන දීමනාවක් ද ඇතුළත් වේ.
- ❖ එසේ දෙන ලද මුදලක්,ණයක් හෝ වෙනත් දෙයක් විය හැකිය. දීමට පොරොන්දු වීම, ලබාදීමට උත්සාහ කරන බව පොරොන්දු වීම ද අල්ලස් දීමකි.
- ❖ ඡන්දය දී තිබීම නිසා හෝ ඡන්දය දීමෙන් වැළකී සිටීම ගැන ඉහත කී ක්‍රියාවන් කිරීම ද ප්‍රමාණවත් වේ.
- ❖ එසේ දෙන දේ දීමට පොරොන්දු වන දේ නිලයක්, තනතුරක්, රැකියාවක් විය හැකිය.ඡන්දය දුන් නිසා හෝ නොදුන් නිසා එසේ කිරීම ද අල්ලසකි.
- ❖ එසේ දෙන දේ (කෙළින් හෝ වක්‍ර මාර්ගයකින්) තෑග්ගක්, ණයක්,යෝජනාවක්, පොරොන්දුවක් ලබා දීමක් හෝ ගෙවීමක් වුවද වරද සිදුවේ. ඒ අනුව ඡන්දයක් ලබා දීම හෝ ලබා දීම සඳහා පොරොන්දු වීම ද වැරදිය.

අල්ලස ලබාගන්නා ඡන්ද හිමියා ද වරදකරුවෙකි. මැතිවරණයට පෙර හෝ එය පැවැත්වෙද්දී හෝ එසේ යම් දෙයක් ලබා ගැනීම,එකඟ වීම, ගිවිසුමක් ඇතිකර ගැනීම මගින් ඡන්ද හිමියාද අල්ලස් ගැනීමේ වරද කරයි. ඉහත විස්තර කළ ආකාරයේ අල්ලසක් තමන් විසින්ම හෝ වෙනත් තැනැත්තෙකු මගින් කෙළින්ම හෝ වක්‍රව මගින් ඉල්ලුම් කරන තැනැත්තාට අල්ලසට වරදකරු වෙයි. ඉහත සඳහන් පරිදි අල්ලසක් දීමට හෝ ලබා දීම පිණිස වසා කරන බවට පොරොන්දු වන තැනැත්තා ද අල්ලස් දීමේ වරද කරයි.

5. දූෂණ ක්‍රියා සම්බන්ධ දඬුවම්

හොර ඡන්ද දැමීම, හොර ඡන්ද දැමීමට අනුබල දීම, සංග්‍රහ කිරීම, අයුතු බලපෑම්, අල්ලස් දීම, මැතිවරණයට පෙර හෝමැතිවරණ කාලය තුළමැතිවරණයේ ප්‍රතිඵලයට බලපෑමක් ඇති විය හැකි පරිදි අසත්‍යය ප්‍රකාශ කිරීම, චරිත ඝාතනය කිරීම, අපේක්ෂකයෙකු ඉල්ලා අස්වූ බවට අසත්‍යය ප්‍රකාශ කිරීම මැතිවරණ දූෂණ ක්‍රියා සම්බන්ධයෙන් දඬුවම් ලැබීමට හේතු වේ. හොර ඡන්ද දැමීම පිළිබඳ දඬුවම බරපතල වැඩ සහිතවමාස 12 ක සිර දඬුවමකි. අනෙක් වැරදි සම්බන්ධයෙන් රු.500/- ක දඩයක් හෝබරපතල වැඩ සහිතව හෝ රහිතව මාස හයක කාලයකසිර දඬුවමක් නියම කිරීම හෝ දඩය හෝ සිර දඬුවම දෙකම නියම කළ හැකිය.

- ❖ මේ සම්බන්ධ නඩු විභාග සිදුවන්නේ මහාධිකරණයේය.
- ❖ නඩු පැවරීමට නීතිපතිගේ අනුමැතිය අවශ්‍යය.
- ❖ වරදකරු වුවහොත් ඉහත දක්වා ඇති දඬුවමට අමතරව අවුරුදු හතකට ප්‍රජා අයිතිවාසිකම් ද අහිමි වේ. මන්ත්‍රී ධූරයක් වී නම් එය ද අහෝසි වේ.
- ❖ කිසියම් අපේක්ෂකයෙකුගේ නියෝජිතයෙකු විසින් ඉහත දූෂණ ක්‍රියාවන් සිදු කරන ලද්දේ නම් එකී අපේක්ෂකයා ඉහත දණ්ඩනයට යටත් කළ හැකි වන අතර ප්‍රජා අයිතිය මෙන්ම මන්ත්‍රි ධූරය ද අහිමි වේ.

## **නීති විරෝධී ක්‍රියා**

1. ගෙවීම් හා ඡන්ද හිමියන් ප්‍රවාහනය

**83 වගන්තිය**

මැතිවරණයකදී කරනු ලබන ඇතැම් ගෙවීම් හෝ වියදම් නීති විරෝධී ක්‍රියාවන් ලෙස මේ කොටසේදි සැලකේ.

- ඡන්ද මධ්‍යස්ථානයේ සිට හෝ ඡන්දය දෙන ස්ථානය වෙතට ඡන්ද හිමියන් ප්‍රවාහනය සඳහා කවර ආකාරයක හෝ ගමන් ගාස්තු ගෙවීමට හෝ ගිවිස ගැනීම නීති විරෝධී ක්‍රියාවකි. (රජය මඟින් හෝ මැතිවරණ කොමසාරිස්වරයාගේ නියමය පරිදි සපයනු ලබන පොදු ප්‍රවාහන සේවා මෙයට අදාළ නොවේ).
- පත්‍රිකා, දැන්වීම් ආදිය ප්‍රදර්ශනය සඳහා ස්ථානයක් පාවිච්චි කිරීම නිසා ඡන්ද හිමියෙකුට ගෙවීමක් කිරීම හෝ කිරීමට ගිවිස ගැනීම නීති විරෝධීය.
- මැතිවරණයට පෙර, පසු හෝ ඒ අතරතුර දී ගෙවීමක් කිරීම හෝ ගෙවීමට ගිවිසුමක් ඇතිකර ගැනීම මෙන්ම ගෙවීමක් ලැබීමත්, ගිවිසුමට පාර්ශවකරුවෙකු වීමත් වැරදිය.
- ඡන්ද විමසීමට පැයකට පෙර සහ එය අවසන් වී පැයකට පසු යන කාලය අතරතුර ඡන්ද මධ්‍යස්ථානයකට හෝ ඒ ස්ථානයේ සිට ඡන්ද දායකයන් ප්‍රවාහනය කිරීම සඳහා ආධාර අනුබල දීම නොකළ යුතුය.

ඉහත සඳහන් ක්‍රියා නීති විරෝධී නොවන අවස්ථා මෙසේය.

- යම් ඡන්ද හිමියෙකු සිය ව්‍යාපාර කටයුත්තක් වශයෙන් ගාස්තු අයකර පත්‍රිකා හා ප්‍රචාරක දැන්වීම් මුද්‍රණය කිරීම නීති විරෝධී නොවේ.
- ගංගාවකින් හෝ මුහුදකින් නොගොස් ඡන්දය දිය නොහැකි අවස්ථාවක ඡන්ද හිමියන්ට මුහුදෙන් හෝ ගංගාවෙන් එතෙරවීමට ඉඩ සැලසිය හැකිය.
- පොදු ප්‍රවාහන සේවය මගින් තමන් අතින් වියදම් කර ඡන්ද පොළට යාම ඒම නීති විරෝධී ක්‍රියාවක් නොවේ.
- ඡන්දයට දින හතකට පෙර තේරීම් භාර නිලධාරියාගෙන් ලබාගත් ලිඛිත අවසරයක් ඇතිව, ශාරීරික දුබලතාවක් සහිත තැනැත්තෙකුට ඡන්ද පොළට යාමට හෝ ඒමට ගමන් පහසුවක් යොදාගත හැකිය. (අපේක්ෂකයෙකු විසින් ඡන්ද හිමියෙකු වෙනුවෙන් එම ලිඛිත අවසරය ඉල්ලා නොසිටිය යුතුය).
- නීති විරෝධී ලෙස පුද්ගලයන් ප්‍රවාහනය කරන විට, තමන්ගේ මෙහෙයවීමෙන් හෝ පැමිණිල්ලක් මත පොලිස් නිලධාරියෙකුට එම වාහනය අත්අඩංගුවට ගෙන ඡන්ද විමසීම අවසන් වන තෙක් පොලිස් ස්ථානයේ රඳවා තබා ගත හැකිය.
- නීති විරෝධී ක්‍රියාවකට වරදකරු වුවහොත් එම කටයුත්තට යොදාගත් වාහනය රාජසන්තක කිරීමට මහාධිකරණයට බලය තිබේ.

2.අසත්‍ය ප්‍රකාශ පළ කිරීම

**84 වගන්තිය**

යම් පුවත්පතක්, සඟරාවක්, පත්‍රිකාවක් හෝ ප්‍රකාශනයක් මගින් අසත්‍ය වූ යමක් පළ කිරීම මෙයින් අදහස් කෙරෙයි. එම අසත්‍ය ප්‍රකාශනයක් මගින් අදාළ මැතිවරණයකදී තරග කරන පිළිගත් දේශපාලන පක්ෂයක, ස්වාධීන කණ්ඩායමක් හෝ අපේක්ෂකයෙකුගේ මැතිවරණ සම්බන්ධ කතා හෝ කටයුතු සම්බන්ධයෙන් විය යුතුය. එම අසත්‍ය ප්‍රකාශය මැතිවරණයේ ප්‍රතිඵල කෙරෙහි බලපෑමක් ඇතිකළ එකක් විය යුතුය. එවැනි ප්‍රකාශයක් අයිතිකරු, කළමනාකරු, සංස්කාරක, ප්‍රකාශක හෝ ලේඛකයා ඒ පිළිබඳ වගකීමට බැඳෙනු ඇත. එක් එක් තැනැත්තා විසින් ඒ සඳහා වගකිව යුතු නොවන බවට අවශ්‍ය කරුණු ඔප්පු කිරීමෙන් නිදහස් විය හැකිය.

3.ගෙවීමකට මැතිවරණ වැඩට ගැනීම

**85 වගන්තිය**

අපේක්ෂකයෙකුට තමන් වෙනුවෙන් මැතිවරණයකදී අවශ්‍ය කටයුතු සඳහා පුද්ගලයන් සේවයේ යොදවා ගැනීමට ඉඩ ඇත්තේ නීතියේ සඳහන් සේවක සංඛ්‍යාව පමණි. ඡන්ද පොළ නියෝජිතයන්, ගණන් කිරීමේ නියෝජිතයන්, ලිපිකරුවන්, පණිවිඩකරුවන් එසේ සේවය යෙදවිය හැකිය. යුක්ති සහගත ප්‍රමාණය ඉක්මවා සේවයේ යෙදවීම නීති විරෝධී ක්‍රියාවක් ලෙස සැලකේ.

4.මුද්‍රිත ප්‍රකාශනවල නම සඳහන් නොකිරීම

**86 වගන්තිය**

ඡන්ද විමසීම ගැන සඳහන් වන ප්‍රචාරක දැන්වීමක්, අත්පත්‍රිකාවක්,ප්‍රදර්ශන පත්‍රයක් එහි ප්‍රකාශකයාගේ හා මුද්‍රණකරුගේ නම සහ ලිපිනය නොමැතිව බෙදාහැරීම හෝ ඇලවීම අපේක්ෂකයෙකු නොවන අයෙකුට නොහැකිය. එසේ නැතිව එවැනි ප්‍රකාශනයක් අලවන නැතිනම් මුද්‍රණය කිරීමට බලකිරීම බෙදා හැරීමට සලස්වන අපේක්ෂකයෙකුගේ ඔහුගේ නියෝජිතයෙකු නීති විරෝධී ක්‍රියාවකට වරදකරු වන්නේය. එවැනි වරදක් සඳහා දඩය රුපියල් පන්දාහකි. මෙවැනි වරදක් සද්භාවයෙන් යුතුව අතපසුවීමකින් සිදුවී ඇත්නම් එය සනාථ කිරීම වරදින් නිදහස්වීමට හේතු වේ. මහේස්ත්‍රාත්වරයෙකුට මේ සඳහා වරදකරු වන පුද්ගලයකුට රුපියල් 500 ක දඩයකට යටත් කළ හැකි ය.

5.නීති විරෝධී ක්‍රියාවලට දඬුවම.

මහාධිකරණයේ වරදකරු කරනු ලැබුවහොත් දඩය රුපියල් 300 කි. එදින සිට අවුරුදු 03 කට ප්‍රජා අයිතිය අහෝසි වේ. නීති විරෝධී ක්‍රියා සම්බන්ධයෙන් නඩු පැවරීමට නීතිපතිවරයාගේ අනුමැතිය අවශ්‍ය වේ .

## <u>දණ්ඩ නීති සංග්‍රහය යටතේ මැතිවරණ වැරදි</u>

ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ දාඃ අ පරිච්ඡේදයේ 169 අ සිට 169 උෟ වගන්තිය දක්වා ඡන්ද විමසීම සම්බන්ධයෙන් අදාළ වන වැරදි සහ දඬුවම් දක්වා ඇත.

එම නීතිය අනුව

1.ඡන්දය පාවිච්චි කිරීමට පෙළඹවීම සඳහා තුටු පඬුරු දීම, ඡන්දය පාවිච්චි කිරීම හෝ පාවිච්චි කිරීමට පෙළඹවීමට තැත් කිරීම සඳහා තෑග්ගක් වශයෙන් තුටු පඬුරක්, තුටු පඬුරක් තෑග්ගක් වශයෙන් භාරගැනීම, අල්ලස් දීම- ගැනීම පිළිබඳව සංයුක්ත කරයි. මහේස්ත්‍රාත් අධිකරණය වරදකරු කරනු ලැබුවහොත් මේ සඳහා රු. 500කට නොවැඩි දඩයකට යටත් විය යුතුය.

2.යම් ඡන්දයක් නිදහස් ලෙස පාවිච්චි කිරීමට කැමැත්තෙන් ම බාධාකරන හෝ බාධා කිරීමට තැත් කරන තැනැත්තෙක් අයථා ලෙස බලය යෙදවීමේ වරද සිදු කරයි. එනම් ඡන්දදායකයාට යම් අන්දමක පාඩුවක් ඇති කිරීමට, තර්ජනය කිරීම සහ තමාට හෝ තමා සැලකිල්ලක් දක්වන පුද්ගලයකු දේව කෝපයකට හෝ ආගමික දොස් පැවරීමට හෝ භාජනය වීමට ඉඩ ඇතැයි අපේක්ෂකයෙකු ඡන්දදායකයෙකු සිතිය හැකි ආකාරයට ක්‍රියා කිරීම මෙහිදී දැක්වේ. එනම්, වැරදි ආකල්ප, කටකතා පතුරුවා හැරීම මේ යටතට වැටේ. ඒ සඳහා වැරදිකරුවකු වන අයෙකුට රු. 500ට වැඩි නොවන දඩයක් නියම කළ හැකිය.

3.ඡන්ද විමසීමකදී ජීවත්ව සිටින හෝ මියගිය අයෙකු නාමයෙන් ඡන්ද පත්‍රිකාවක් ඉල්ලා සිටීම ඒ නමින් ම ඡන්දය දීම හෝ එවැනි ක්‍රියාවකට අනුබල දීම හෝ ඉහත කී කාර්යය සඳහා තැත්කිරීම ද අන්‍යයන් වෙනුවෙන් පෙනී සිටීමක් වශයෙන් දැක්වේ. මේ සඳහා වැරදිකරුවකු වුවහොත් දඩය රු. 300 කට නොවැඩි මුදලකි.

**මැතිවරණයේ දි රාජ්‍ය දේපල අවභාවිත කිරීම**

අමාත්‍යංශ, රාජ්‍ය සංස්ථා,දෙපාර්තමේන්තු ඇතුළුව රජයට අයත් සියලුම නිශ්චල හා චංචල දේපල, රාජ්‍ය දේපල හෙවත් පොදු දේපල ලෙස හැඳින්විය හැකිය. රජයේ ඉඩම්, ගොඩනැගිලි, වාහන, මහජන මුදල් රාජ්‍ය ආයතනයන් භාරයේ ඇති වෙනත් භාණ්ඩ ආදිය ඒ යටතට අයත් වේ. මැතිවරණයකදී මෙකී රාජ්‍ය දේපල කුමන හෝ

පක්ෂයක, කණ්ඩායමක හෝ අපේක්ෂකයකුගේ දේශපාලන කටයුතු භාවිතා කිරීම නීතියෙන් තහනම් ක්‍රියාවක් මෙන් ම බරපතල මැතිවරණ නීති උල්ලංඝනයක් ද වේ.

19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ යම් රාජ්‍ය දෙපලක් ඡන්ද විමසීමකදී අපේක්ෂකයන් හෝ කණ්ඩායම් හෝ පක්ෂ ප්‍රවර්ධනයට භාවිතා කිරීම තහනම් කිරීමේ බලය මැතිවරණ කොමිසමේ උපදෙස් මත එහි සභාපති හෝ මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයා වෙත පවරා තිබේ.

1982 අංක 12 දරණ පොදු දේපලවලට එරෙහි වැරදි පනත යටතේ යම්කිසි පොදු දේපලක් පෞද්ගලික කටයුත්තකට යොදා ගැනීම එකී පොදු දේපල අවභාවිත කිරීමක් වේ. එය වසරක සිර දඩුවමේ සිට වසර විස්ස දක්වා සිරදඬුවම් නියම කළහැකි අපරාධ වරදක් ලෙස දක්වා ඇත.

යම් රජයේ නිලධාරියෙකු කිසියම් රජයේ දේපලක් තමන්ගේ හෝ වෙනත් අයෙකුගේ පෞද්ගලික ප්‍රතිලාභය සඳහා යොදවන්නේ නම් එය 1994 අංක 20 දරණ සංශෝධිත අල්ලස් පනතේ 70 වගන්තිය ප්‍රකාරව දූෂණය නම් වරද යටතට වැටේ. ඒ අනුව රජයේ නිලධාරින් විසින් තමන්ගේ භාරයේ හෝ අධීක්ෂණය යටතේ පවතින පොදු දේපල දේශපාලන ප්‍රචාරණ කටයුතු සඳහා භාවිතා කරන්නට ඉඩහැරීම බරපතල වරදක්වේ.